www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කුමන දක්ෂිනාංශික මාවත ගත යුතු ද යන්න මත ඉන්දියානු ස්ටැලින්වාදියෝ භේද වෙති

## Indian Stalinists split over what right-wing course to follow

**දීපාල් ජයසේකර විසිනි**
**2010 ජුලි 17**

මධ්‍යම ආන්ඩුව ක්‍රියාවට දැමූ ඉන්ධන මිල ඉහල දැමීමට එරෙහිව පසුගිය සතියේ පැවති එක් දින හර්තාලය, ඉන්දියාවේ ප්‍රධාන ස්ටැලින්වාදී පාර්ලිමේන්තු පක්ෂය වන ඉන්දියානු (මාක්ස්වාදී) කොමියුනිස්ට් පක්ෂය නොහොත් සීපීඑම් තුල වැඩෙන භේදය එලිමහනට ගෙනැවිත් ඇත.

දිගු කලක් තිස්සේ වැඩෙන මෙම භේදය, පක්ෂයේ ජාතික නායකත්වයට එරෙහිව, බටහිර බෙංගාල පක්ෂ ඒකකයේ නායකත්වය පිහිටුවා තිබේ. බටහිර බෙංගාල ප්‍රාන්තය තුල සීපීඑම් නායකත්වයෙන් යුක්ත වාම පෙරමුන වසර 33ක් තිස්සේ ආන්ඩු කරයි.

භේදයට පාදක වී ඇති කාරනය වන්නේ සීපීඑම් අනුගමනය කල යුත්තේ කුමන දක්ෂිනාංශික මාවත ද යන්න යඃ එනම්, එය ඉන්දියානු ධනේශ්වරයේ ප්‍රමුඛ දේශපාලන පක්ෂය ද වත්මන් එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධාන (යූපීඒ) සභාග ආන්ඩුවේ නායකත්වය ද වන කොංග්‍රස් පක්ෂය සමග සිය හවුල්කාරිත්වය යලි අලුත් කිරීමට උත්සාහ කල යුතු ද නැත හොත් හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂය (බීජේපී) සමග පෙල ගැසීමේ විභවය ද සහිතව විරුද්ධ පක්ෂ සමග සන්ධාන ගත විය යුතු ද යන්න පිලිබඳවය.

2004 මැයි මාසයෙන් ඇරඹුනු වසර හතරක කාලයක් තිස්සේ වාම පෙරමුන යූපීඒ ආන්ඩුවට පාර්ලිමේන්තු බහුතරය සපයාලීය. එහෙත්, 2008 ජුලි මස, කොංග්‍රස් පක්ෂය එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සමග "ගෝලීය මූලෝපායික" හවුල්කාරිත්වයක් තහවුරු කරගැනීමේ විධික්‍රමයක් ලෙස සංකල්පනය කෙරෙන, ඉන්දු-එක්සත් ජනපද සිවිල් න්‍යෂ්ටික ගිවිසුම ඉදිරියට තල්ලු කිරීමට ක්‍රියා කල තතු යටතේ, වාම පෙරමුන සිය සහයෝගය ඉවත් කර ගත්තේය.

පසුගිය සතියේ හර්තාලයේ දී බීජේපීය සමග පොදු අරමුනක් උදෙසා කටයුතු කලේ යයි, බටහිර බෙංගාල සීපීඑම් හා ආන්ඩු නායකයෝ, සීපීඑම් ජාතික නායකත්වයට පහර එල්ල කර තිබේ. එසේ කිරීම මගින්, ජාතික නායකත්වය, ජාතිවාදයේ ප්‍රමුඛතම විරුද්ධවාදියා බවට වාම පෙරමුන කරන කියාපෑමට වලකපා, ඊලඟ වසරේ බටහිර බෙංගාල ප්‍රාන්ත මැතිවරනයේ දී මුස්ලිම් ජනයාගේ සහයෝගය දිනාගැනීමේ සීපීඑම් ප්‍රයත්නයන්ට හානි කර ඇතැයි ඔවුහු තර්ක කරති.

සිය වාම පෙරමුනු හවුල්කරුවන් සහ විවිධ ප්‍රාන්තීය හා කුල-පාදක පක්ෂ සමග එක්ව ජුලි 5 දා තමන් පැවැත්වූ විරෝධතා වර්ජනය, බීජේපීය හා එහි ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය (එන්ඩීඒ) කැඳවූ වර්ජනයෙන් මුලුමනින්ම ස්වාධීන හා වෙන්වූ එකක් බව, සීපීඑම් ජාතික නායකත්වය කියාපායි. කෙසේවෙතත්, වර්ජනයට පෙරාතු දින කිහිපය තුල දී, වාම නායකයන් එන්ඩීඒ කැඳවුම්කරු සමග සමීප සබඳතා පැවැත්වූවේ ය යන කාරනය දැන් එලිමහනට පැමින තිබේ. එමෙන්ම වර්ජනයේ සාර්ථකත්වය ගැන පුරසාරම් දෙඩීමේ දී, සීපීඑම් නායකත්වය, වාම පෙරමුනේ ධජය යටතේ බලමුලුගැන්වුනු අය සහ බීජේපීයේ කැඳවුමට අනුව විරෝධතා දැක්වූ අය අතර කිසියම් හෝ වෙනසක් ඇති බව දැක්වීමට කිසිදු ප්‍රයත්නයක් දැරුවේ නැත. ඉන්ධන මිල පාලනය ඉවත් කිරීමට මුලින්ම උත්සාහ දැරුවේ, 2002 දී එවකට ඉන්දියානු ආන්ඩුවට නායකත්වය දුන් බීජේපී ය යන කාරනාව පවා සීපීඑම් නායකත්වය සඳහන් කලේ කල් පසුවය.

මෑත පාර්ලිමේන්තු අයවැය සැසිවාරය තුල දී වාම පෙරමුනු නායකයන් දෙදෙනෙක් -- සීපීඑම් නායකයෙක් හා ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (සීපීඅයි) නායකයෙක් -- යූපීඒ ආන්ඩුවේ විවිධ පියවරයන්ට එරෙහිව ඒකාබද්ධව විරුද්ධත්වය දැක්වීම පිලිබඳව සාකච්ඡා කරනු පිනිස බීජේපී පාර්ලිමේන්තු නායිකාව වන සුෂ්මා ස්වරාජ් හමුවූ බවට, හර්තාලය මුවවිට දී හිටපු බීජේපී නායක එල්.කේ. අද්වානි එලිදරව් කල කල්හි, බීජේපීය පිලිබඳ සිය ආකල්පයේ කිසිදු වෙනසක් සිදු වී නැති බවට සීපීඑම් ජාතික නායකත්වය කරන අවධාරනයට දරුනු ලෙස වලකපා ඇත.

බටහිර බෙංගාල සීපීඑම් නායකත්වය, බීජේපීයේ ස්වරාජ් සමග පැවති හමුවෙන් ඈත් වී ගැනීමටත් ජාතික පක්ෂ නායකත්වයේ පිලිවෙතට පහර දීමට එය යොදා ගැනීමටත් වහාම පැනගති. සීපීඑම් ප්‍රාන්ත ආන්ඩුවේ ඇමතිවරයකු වන පක්ෂයේ ප්‍රාන්ත

කමිටු සාමාජිකයෙක් මෙසේ ප්‍රකාශ කලේය: "බෙංගාලයේ සියයට 25ක මුස්ලිම් ජනගහනයක් සිටිනවා. ඔවුන්ගෙන් විශාල කොටසක් අප හැර ගිහින්. . . . ඒ ඔක්කොටම පස්සෙ, අපේ පක්ෂ නායකයො පාර්ලිමේන්තු වැඩකටයුතුවලට හෝ වෙනත් මොන හේතුවකට හෝ බීජේපී කාර්යාලයට ගියොත් ඒක අපේ සහයෝගය තව දුරටත් බාදනය වෙන්න හේතු වෙන්න පුලුවන්."

බීජේපීයට අත දිගු කිරීමේ සීපීඑම් ජාතික නායකත්වයේ පිලිවෙතෙහි මැතිවරනමය බලපෑම ගැන බටහිර බෙංගාල සීපීඑම් නායකත්වය උත්සුක වන බවට සැකයක් නැත. විවෘතවම මහා ව්‍යාපාරික-ගැති "කාර්මීකරනය" පිලිබඳ පිලිවෙතක් මත පාදකව 2006 දී යලි බලය දිනාගැනීමෙන් පසුව මේ දක්වා, වාම පෙරමුන බටහිර බෙංගාලය තුල මැතිවරන පරාජයන් මාලාවක් ම අත්විඳ ඇත. එලඹෙන ප්‍රාන්ත මැතිවරනයේ දී එහි පරාජය දැන් පුලුල්ව පෙරදකින දෙයකි.

එහෙත්, බටහිර බෙංගාල මහ ඇමති හා සීපීඑම් දේශපාලන කමිටු සාමාජික බුද්ධාදෙව් භට්ටාචාර්ජී ජුලි 3-4 දේශපාලන කමිටු රැස්වීමේ දී ජුලි 5 හර්තාලයෙන් බටහිර බෙංගාල ඉවත් කරන ලෙස ඉල්ලා සිටීමටත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කල විට එම රැස්වීමෙන් නැගිට යාමටත් හේතුව, බීජේපීය වෙත අත දිගු කිරීමේ සීපීඑම් පිලිවෙත ගැන ඔවුන්ට පවතින උත්සුකතා නොවේ.

භට්ටාචාර්ජී හර්තාල් සහ මහජන විරෝධතා දැක්වීමේ සෙසු රූපාකරයන් පිලිබඳව නැවතනැවතත් පැමිනිලි කර තිබේ. ඒ මක් නිසා ද කියතොත්, එවන් ක්‍රියාමාර්ග බටහිර බෙංගාලය ඉන්දියාවේ වඩාත්ම ආයෝජක-මිත්‍ර ප්‍රාන්තය බවට පත් කිරීමේ ඔහුගේ ව්‍යායාමයට වල කපන නිසාය. 2005 දී මෙවන් එක් දින හර්තාලයක්, කොල්කතා නගරය තුල හා ඒ අවට තොරතුරු තාක්ෂන හා තොරතුරු තාක්ෂන-සම්පාදිත සමාගම්වල වැඩ අවුල් කල කල්හි, එවැන්නක් යලි සිදු වීමට තමන් ඉඩ නොතබන බවට භට්ටාචාර්ජී මහ ව්‍යාපාරිකයන්ට වහාම සහතික වුනි.

බටහිර බෙංගාලයේ වාම පෙරමුන දැන් නියත මැතිවරන පරාජයකට මුහුන දී සිටින්නේ නම්, එයට හේතුව වන්නේ, එහි දූෂනය ද විශේෂ ආර්ථික කලාප සඳහා සිය ඉඩම් පවරාගැනීමට එරෙහිව විරෝධය දැක්වූ ගොවිජනයාට වෙඩි තබා මරා දැමීම හා වර්ජන තහනම් කිරීමේ නීති ඇතුලු, දක්ෂිනංශික පිලිවෙත් ද නිසා බෙංගාලයේ කම්කරුවන් හා සෙසු පීඩිත ජනයා එය සමග විරසක වීමයි.

භට්ටාචාර්ජී සහ බටහිර බෙංගාලයේ ස්ටැලින්වාදීන් මෙයට ප්‍රතිචාර දක්වා ඇත්තේ තව දුරටත් දකුනට පැදීම මගිනි. වාම පෙරමුන ඔවුන්ගේ ලාභ සඳහා හොඳම සහතිකය ද ඔවුන්ගේ ආඥාවන් මහජනයා මත බලහත්කාරයෙන් පැටවීමේ හොඳම ඒජන්සිය ද බවට මහ ව්‍යාපාරිකයන්ට ඒත්තුගැන්වීම මගින් බලයේ එල්ලී සිටීමේ උත්සාහයක ඔවුහු යෙදී සිටිති.

වාම පෙරමුනු පාලනයේ 33 වන සංවත්සරය සමරනු වස් ජූලි 21 දා පැවති උත්සවයක දී, භට්ටාචාර්ජී අරාජකත්වයට එරෙහිව පර්යායේ ආරක්ෂකයකු ලෙස සීපීඑම් විවෘතවම හුවාදැක්වීය. "විරුද්ධ පක්ෂ ඉල්ලා සිටින මේ වෙනස මොකක්ද?" යයි ඔහු විමසීය. අනතුරුව ඔහු මෙසේ පිලිතුරු දුනි: "ඉල්ලා සිටින ආකාරයේ වෙනසක ප්‍රතිඵලය වනු ඇත්තේ අරාජකත්වයයි."

සින්ගූර් ප්‍රදේශයේ ටාටා සමාගමේ මෝටර් රථ නිෂ්පාදන කම්හලක් සඳහා ඔවුන්ගේ ඉඩම් පවරාගැනීමේ ආන්ඩුවේ පියවරට එරෙහි ගොවිජනයාගේ වෛරය ගසාකෑමට විරුද්ධ පාක්ෂික ත්‍රිනමූල් කොංග්‍රසය දැරූ උත්සාහයට සැඳහුම් කරමින්, භට්ටාචාර්ජී තව දුරටත් මෙසේ විමසීය: "බටහිර බෙංගාලය දකිනු ඇත්තේ ආයෝජන ආපසු හරවා යවන සින්ගූර් පමනක් ද?"

මෙම දක්ෂිනාංශික පිලිවෙතට ගැලපෙන පරිදි, බටහිර බෙංගාලයේ සීපීඑම්, ත්‍රිනමූල් කොංග්‍රසය සමග පවත්නා සිය මැතිවරන සන්ධානය බිඳින ලෙස, ඉන්දියාවේ ජාතික පාර්ලිමේන්තුවේ විශාලතම පක්ෂය වන නමුදු බටහිර බෙංගාලයේ තෙවන තැන දරන, කොංග්‍රස් පක්ෂයට ආයාචනා කිරීමේ මංමුලාසහගත තැනක යෙදී සිටී.

කෙසේවෙතත්, කොංග්‍රස් පක්ෂය එවන් යෝජනාවක් අවධාරනාත්මකව ප්‍රතික්ෂේප කර තිබේ. කොංග්‍රස් නායකත්වය සමග පැවති ආසන බෙදා ගැනීමේ සාකච්ඡා බිඳවැටීම නොතකා ත්‍රිනමූල් කොංග්‍රසය ප්‍රමුඛ ජයග්‍රහනයක් ලබා ගත් මෑත නගර සභා මැතිවරනයට පසුව, කොංග්‍රස් පක්ෂය ත්‍රිනමූල් කොංග්‍රසය සමග පවත්නා සිය සන්ධානය යලි තහවුරු කලේ, එලඹෙන ප්‍රාන්ත මැතිවරනයේ දී වාම පෙරමුනු-විරෝධී බලවේගවලට නායකත්වය දීමේ අයිතිය එය දිනාගෙන ඇති බව ද සඳහන් කරමිනි.

සීපීඑම් ජාතික නායකත්වයේ පිලිවෙත මෙයින් තරමක් වෙනස් වුව ද එය ඊට නොඅඩු ලෙස කම්කරු පන්තියේ මූලික අවශ්‍යතාවන්ට එරෙහිව පවතී.

ආහාර මිල ගනන් ඉහල යාමට ද රාජ්‍ය අංශයේ ආයතන පුද්ගලීකරනය කිරීමට හෝ ආංශිකව පුද්ගලීකරනය කිරීමට යූපීඒ ආන්ඩුව ගෙනයන වැඩපිලිවෙලට ද විරුද්ධව සටන්කාමී අරගල මාලාවක් පැන නගින තතු යටතේ, එය යෙදී සිටින්නේ, "මහජන-හිතැති" පිලිවෙත් පිලිගන්නා ලෙස යූපීඒ ආන්ඩුවට බලපෑම් දැමීමේ එල්ලය සහිත විරෝධතා දඬුඅඬුව ද විරුද්ධ පක්ෂ සමග සිදු කරන පාර්ලිමේන්තු උපාමාරු ද තුල කම්කරු පන්තිය සීමා කොට හිර කිරීමේ ප්‍රයත්නයකය.

කොංග්‍රස් පක්ෂය තථ්‍ය වසයෙන් වාම පෙරමුන සිය ආන්ඩුවෙන් එලියට විසි කල බැවින්

යූපීඒ සමග පැවති සිය සන්ධානය බිඳවැටීමෙන් පසුව, සීපීඑම් නොපමාව, මහා පරිමානව කම්කරුවන් දොට්ටදැමීම හා හොරිකඩයන් බඳවාගැනීම මගින් 2002 දී තමිල්නාඩු ප්‍රාන්තයේ රාජ්‍ය අංශයේ වර්ජනයක් බිඳදැමූ ඒඅයිඒඩීඑම්කේ (සමස්ත ඉන්දියානු අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම්) ඇතුලු, බීජේපී සහ/හෝ කොංග්‍රසයේ පැරනි සගයන්ගෙන් සමන්විත විවිධාකාර පක්ෂ එකතුවක් සමග සන්ධානයක් තනාගති. එහි තවත් සන්ධාන සගයකු වූයේ, අන්ද්‍ර ප්‍රදේශ් ප්‍රාන්තයේ අවසාන වතාවට බලයේ සිටි කාලය තුල දී වෙලඳ පොල-හිතැති පිලිවෙත් ක්‍රියාවට දැමීම නිසා ලෝක බැංකුවෙන් ප්‍රශංසා ලබා ලත් තෙලිගු දේසම් පක්ෂයයි.

දැන්, ධනේශ්වර සංස්ථාපිතයේ දේශපාලනය තුල සිය ආනුභාවය රඳවා ගැනීමේ ද සිය පාර්ලිමේන්තු උපාමාරුවලට වඩා විශ්වාසනීය පෙනුමක් දීමේ ද අදහසින් යුක්තව, සීපීඑම්, හින්දු අධිපතිවාදී බීජේපීය වෙත සිය දෑත් දිගු කරයි. එසේ කිරීම මගින්, ස්ටැලින්වාදියෝ මෙම අර්බුද-ග්‍රස්ත විෂසෝර ජාත්‍යොත්තමවාදී පක්ෂයට යුක්තියුක්ත භාවයක් සම්පාදනය කරයි.

ස්ටැලින්වාදීන් මෙම පිලිවෙතෙහි තව දුර නොයනු ඇතැයි යන්න තීන්දු කල නොහැකිය. එවන් මාවතක් කම්කරු පන්තියට දැවැන්ත අන්තරායන් ගෙන එනු ඇත. පසුගිය දශක දෙක තිස්සේ, සීපීඑම්, බීජේපීය දේශපාලනිකව මොනම සම්බන්ධයක් වත් නොපැවැත්විය යුතු පක්ෂයක් ලෙස සැලකූ අතර කම්කරු පන්තිය දක්ෂිනාංශික වෙලඳ පොල-හිතැති ප්‍රතිසංස්කරනවලට කැපවූ එක් ආන්ඩුවකින් පසුව තවත් එවන් ආන්ඩුවකට යටත් කිරීමේ සිය පිලිවෙත යුක්තියුක්ත කලේ බීජේපීය බලයට පැමිනීම වැලැක්වීමේ නාමයෙනි. එහෙත් අමතක නොකල යුතු කාරනයක් වන්නේ, සීපීඑම් 1977 දී ජනතා පක්ෂය (බීජේපීයේ පූර්වගාමියා වූ ජන සංග් සංවිධානය විසුරුවා හැරුනේ එම පක්ෂය තුලට ය) බලයට පැමිනීමට සහයෝගය දුන් බවයි. එමෙන් ම 1989-90 දී එය කොංග්‍රසයෙන් කැඩී ගිය වී.පී. සිංගේ නායකත්වයෙන් යුක්ත ජාතික පෙරමුනු ආන්ඩුවට මුක්කු ගැසීමට බීජේපීය සමග එක්විය.

සීපීඑම් බටහිර බෙංගාල ඒකකය හා ජාතික පක්ෂ නායකත්වය අතර භේදය දිගුකලක් තිස්සේ පවතින එකකි. බටහිර බෙංගාල පක්ෂ නායකත්වය 2008 ජුලි මස කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත යූපීඒ ආන්ඩුවට දෙන සහයෝගය ඉවත් කරගැනීමේ තීන්දුවට විරුද්ධ වූ බව ප්‍රසිද්ධ කරුනකි. එමෙන්ම එය, යූපීඒ ආන්ඩුවට දෙන සහයෝගය ඉවත් කරගැනීමේ කොටසක් ලෙස සිය ලෝක් සභා කතානායක තනතුරෙන් ඉල්ලා අස්වන ලෙස පක්ෂ නායකත්වය දුන් උපදෙස් පිලිපැදීමට අපොහොසත් වීම නිසා සෝම්නාත් චැටර්ජි පක්ෂයෙන් නෙරපා හැරීමට ද විරුද්ධ විය. පසු කලෙක චැටර්ජි කියාසිටියේ, විශ්වාසභංග යෝජනාවේ දී ඡන්ද සමාන වන තත්වයක් ඇති වී කතානායකයේ තීරනාත්මක ඡන්දය පාවිච්චි කිරීමට තමන්ට සිදු වූයේ නම් තමන් යූපීඒ ආන්ඩුව බලයේ තබා ගැනීම පිනිස සිය ඡන්දය දෙන බවයි.

ජාතික පක්ෂ නායකත්වයට පවත්නා සිය විරුද්ධත්වය ප්‍රදර්ශනය කිරීමේ පියවරක් ලෙස, බටහිර බෙංගාලයේ සීපීඑම් නායකත්වයෙන් යුක්ත වාම පෙරමුනු ආන්ඩුව, දිවංගත සීපීඑම් බටහිර බෙංගාල මහ ඇමති ජෝති බාසුගේ ජන්ම දිනය සමරමින් ජුලි 8 දා දේශනයක් පවත්වන ලෙස චැටර්ජිට ආරාධනා කලේය. භට්ටාචාර්ජි චැටර්ජි සමග එකම වේදිකාවේ පෙනී සිටි නමුත් සීපීඑම් ප්‍රධාන ලේකම් ප්‍රකාශ් කරාට් සහ සෙසු ඉහල පෙලේ ජාතික නායකයෝ එම අවස්ථාවට සහභාගි වූයේ නැත.

සීපීඑම් දේශපාලන මන්ඩල සභිකයකු වන සීතාරාම් යෙචුරිට කොංග්‍රස් පක්ෂ නායකත්වය සමග වඩා හොඳ සබඳතා පවතින බැවින්, කරාට් වෙනුවට ඔහු පක්ෂ නායකත්වයට පත් කර ගැනීමේ හැකියාවක් ඇතැයි, ජූනි මාසයේ දී, මාධ්‍ය වාර්තා පල විය.

පැහැදිලිව ම, සීපීඑම් දරුනු ලෙස භේද වී ඇත. සිය බටහිර බෙංගාල බලකොටුව ද දශක තුනකට වැඩි කලක් තිස්සේ ඉන්දියාවේ ජනගහනයෙන් සිවු වන තැන දරන ප්‍රාන්තයේ ආන්ඩු බලය දැරීමත් සමග බැඳුනු සියලු ප්‍රතිලාභ හා වරප්‍රසාද ද අහිමි වීම, මෙම භේද අතිමහත් ලෙස උත්සන්න දරනු ඇත.

එහෙත් කන්ඩායම් දෙකෙහි ආස්ථානවල පවත්නා මූලික පොදු බව හඳුනාගත යුතුය.

බටහිර බෙංගාලයේ, කේරලයේ හා ත්‍රිපුර සීපීඑම් නායකත්වයෙන් යුක්ත ආන්ඩු විසින් ගෙනයනු ලබන නව-ලිබරල්වාදී ආර්ථික පිලිවෙත් සම්බන්ධයෙන් හෝ "සමාජවාදය ඈත අනාගතයට අයිති දෙයක්" බවට භට්ටාර්ජි කල කුප්‍රකට කියාපෑම සමග හෝ කිසිඳු මතභේදයක් නැත.

2004 දී යූපීඒ නිර්මානය කිරීමෙහිලා සීපීඑම් නායකත්වයෙන් යුක්ත වාම පෙරමුන ඉටු කල තීරනාත්මක ක්‍රියාකලාපය ද ඊලඟ වසර හතර තිස්සේ එය කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත ආන්ඩුව දුන් සහයෝගය ද උද්යෝගිමත්ව ආරක්ෂා කිරීමේ කරාට් දිගටම යෙදී සිටී.

කන්ඩායම් දෙකම මධ්‍යම ආන්ඩුවේ මාඕවාදී විරෝධී කැරලි මර්දන යුද්ධය වන ග්‍රීන් හන්ට් (හරිත දඩයම) මෙහෙයුමට බටහිර බෙංගාලයේ වාම පෙරමුනු සහභාගි වීමට සහයෝගය දෙයි. මෙම මෙහෙයුමේ අරමුන වන්නේ, ඉන්දියාවේ නැගෙනහිර හා මධ්‍යම කඳුකර ප්‍රදේශවල වන හා ඛනිජ සම්පත් සූරාකෑමේ එල්ලයෙන් යුක්තව එම ප්‍රදේශ මහ ව්‍යාපාරික දැවැන්ත ව්‍යාපෘති සඳහා විවෘත කරගැනීමට එරෙහි ගෝත්‍රික ජනයාගේ විරුද්ධත්වය මැඩීමයි.

අවසන් එහෙත් වැදගත්කමින් නොඅඩු කාරනාව නම්, ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ කර්තව්‍යයන්

සම්පූර්න කෙරී නැත යන පදනම මත ධනේශ්වරයේ පක්ෂවලට කම්කරු පන්තිය දේශපාලනිකව යටත් කිරීම වසර 75කට වැඩි කලක් තිස්සේ යුක්තියුක්ත කරමින් සිටින ඉන්දියානු ස්ටැලින්වාදයේ ජාතිකවාදී, පන්ති-සහයෝගිතාවාදී සම්ප්‍රදායන් මුලුමනින්ම ආරක්ෂා කිරීමේ භාවිතාවක කන්ඩායම් දෙකම යෙදී සිටීමයි.

තථ්‍ය කාරනාව නම්, ඉන්දියාවේ ඓතිහාසික අත්දැකීම ඛේදනීය ලෙස මෙම පිලිවෙතෙහි ප්‍රතිවිරුද්ධය පෙන්නුම් කිරීමයි. ඉඩම්හිමියන්ගේ බලය, කුලවාදය සහ අධිරාජ්‍ය පීඩනයේ හා වැඩවසම් පසුගාමිත්වයේ සෙසු උරුමයන් අහෝසි කෙරෙනු ඇත්තේ, කම්කරු පන්තිය ඉන්දියානු ධනවාදයට එරෙහි සාර්ථක අරගලයක දී සෙසු පීඩිතයන් තමන් වටා රැලි කරගත් විට පමනි.

ඉන්දියානු කම්කරුවන් හා සමාජවාදී-හිතැති තරුනයන් හා බුද්ධිමතුන් සීපීඑම් හා එහි වාම පෙරමුන ප්‍රදර්ශනය කරන දේශපාලන බංකොලොත්කමින් වඩාත්ම දුර දිග යන නිගමන උකහා ගත යුතු ය. මෙම සංවිධාන ඉන්දියානු ධනේශ්වරයේ පාලනය ආරක්ෂා කරන මුක්කුවලට වඩා වැඩි දෙයක් නොවේ. සියල්ලටමත් වඩා අවශ්‍ය වන්නේ, මාක්ස්වාදයේ-ලෙනින්වාදයේ වත්මන් ප්‍රකාශනය වන ට්‍රොට්ස්කිවාදයට හැරීගැනීමයි.

© www.wsws.org